# බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2014 (2015)

## (05) බෞද්ධ සමාජ දර්ශනය

කාලය පැ. 3 යි.

**( I කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.)**

### I කොටස

01. i. ආ) ' පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතෝ හෝති ' යන පාඨය සම්පූර්ණ කර ලියන්න.

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

ආ) මෙම පාඨයේ අදහසට අනුව, එය කුමන භාවනාවක් හා සම්බන්ධ වේද?

.......................................................................................................................

.......................................................................................................................

ii. අ) ' රෝගී භික්ෂුවකට උපස්ථාන කරමින් ගිලානෝපස්ථානයේ අගය බුදුරජාණන් වහන්සේ ආදර්ශයෙන් දක්වා වූ සේක.' එසේ උපස්ථාන ලද භික්ෂුව කවරෙක්දැ'යි නම් කරන්න.

.......................................................................................................................

ආ) වර්ණ භේද සංකල්පය සාවද්‍ය බව දක්වමින් සමාජ සංස්ථාවල ක්‍රම විකාශය පිළිබඳ ව බුදුරදුන් වදාළ ප්‍රකට දේශනය නම් කරන්න.

.......................................................................................................................

iii. අ) සිඟාලෝවාද සූත්‍රයේ ' යට දිසා නමස්කාරයෙහි' සේවකයෙකුගේ වෘත්තිය අයිතිවාසිකම් ප්‍රදානය කළ යුතු බව දැක්වේ. ස්වාමියකු විසින් ප්‍රදානය කළ යුතු එවැනි සේවක අයිතිවාසිකම් දෙකක් නම් කරන්න.

.......................................................................................................................

.......................................................................................................................

ආ) " මාතා පිතා දිසා පුබ්බා" යන ගාථාව සම්පූර්ණ කර ලියන්න

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

iv. අ) ගුරුවරයෙකු හෝ ගුරුවරියක විසින් ඉගැන්වීම් කාර්යයේ දී විශේෂයෙන් අවධානය යොමු කළ යුතු මූලික කරුණු තුනක් සිඟාලෝවාද සූත්‍රයේ ' දකුණු දිශා නමස්කාරයෙහි' දැක්වේ. ඉන් දෙකක් ලියන්න.

.......................................................................................................................

.......................................................................................................................

ආ) බුදුරදුන් දෙව් මිනිසුන්ගේ ගුරුවරයා බව නව අරහාදී බුදුගුණ පාඨයෙහි දැක්වේ. එම යෙදුම උපුටා ලියන්න.

.......................................................................................................................

v. අ) රටක් පාලනය කිරීමේ දී රජෙකු වෙතින් දිස්විය යුතු ගුණාංග දහයක් බුදුදහමෙහි දැක්වේ. ඉන් හතරක් ලියන්න.

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................



Scanned by CamScanner

vi. ඇ) මතු ඇතිවන සක්විති රාජ්‍යයේ හා එහි පාලකයාගේ නම චක්කවත්ති සීහනාද සූත්‍රයේ දැක්වේ. එම රාජ්‍යයේ නම හා රජුගේ නම ලියා දක්වන්න

ආ) සිඟාලෝවාද සූත්‍රයේ දැක්වෙන සදිසා නමස්කාරයේ යට දිසාවට අයත් පුද්ගලයන් දෙකොටස නම් කරන්න.

vii. ඇ) ආර්ථිකය හා බැඳුණු සතර ආකාර සැපයක් බුදුදහමෙහි දැක්වේ. ඉන් දෙකක් නම් කරන්න.

ආ) ' න අත්තහේතු න පරස්ස හේතු' යන ගාථාව සම්පූර්ණ කර ලියන්න.

viii. ඇ) ආර්ථික සමෘද්ධියට හේතුවන මූලික කරුණු හතරක් ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දැක්වේ. ඉන් දෙකක් නම් කරන්න.

ආ) " එකේන භෝගේ භුඤ්ජෙය්‍ය' යන ගාථාව සම්පූර්ණ කර ලියන්න.

ix. ඇ) ' ජයං වේරං පසවති' යන ගාථාව සම්පූර්ණ කර ලියන්න.

ආ) මේ ගාථාවෙහි දැක්වෙන පරාජිතයාගේ හා උපශාන්ත තැනැත්තාගේ ස්වභාවය කෙටියෙන් දක්වන්න.

x. ඇ) සමාජ සම්බන්ධතා මැනවින් පවත්වා ගැනීමේ අවශ්‍යතාව ගැන උපදෙස් දෙන ප්‍රකට සූත්‍රය නම් කරන්න.

ආ) මව්පියන් උතුම් බව ප්‍රකට කිරීම සඳහා ඔවුන් හැඳින්වීමට බුදුරදුන් භාවිත කළ යෙදුම් දෙකක් නම් කරන්න.

* * *



Scanned by CamScanner

# බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2014 (2015)

## (05) බෞද්ධ සමාජ දර්ශනය

කාලය පැ. 3 යි.

( ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

II කොටස

02. i. විවාහයේ දී අඹු සැමියන් ගැළපෙන ආකාරය අනුව සතර වර්ගයකට විවාහ ජීවිත දක්නට ඇතැයි බුදු සමය පවසයි. එම වර්ග හතර නම් කරන්න.

ii. ස්වාමි පුරුෂයෙකු කෙරෙහි පිළිපදින ආකාරය අනුව භාර්යාවන් වර්ග හතකට අයත් කොට බුදු සමය දක්වයි. එම වර්ග හත නම් කරන්න.

iii. " විවාහ ජීවිතය ගෘහස්ථ සංස්කෘතියෙහි අංගයක් බව පිළිගනිමින් එහි සාර්ථකත්වය අරමුණු කරගත් සදාචාර උපදේශ පද්ධතියක් බුදුසමය ඉදිරිපත් කරයි" යන ප්‍රකාශය තහවුරු කරන්න.

03. i. රාජ්‍යයක ආගමික සහජීවනයට හේතුවන කරුණු දෙකක් සප්ත අපරිහානීය ධර්මවල ඇතුළත් වේ. මහා පරිනිබ්බාන සුත්‍රයේ දැක්වෙන එම කරුණු දෙක දක්වන්න

ii. " බුද්ධ කාලයේ සිටි විවිධ ආගමික ශාස්තෲවරුන් අතර ආගමික සහජීවනයක් නොපැවතුණි" යන්න සනාථ කිරීමට කරුණු දක්වන්න.

iii. " ආගම මුල්කරගෙන කිසිවෙකු සමඟ ගැටී අරගල අර්බුධ ඇතිකරගන්නට ආගමික සහජීවනය අගයන බෞද්ධයෝ නොපෙළඹෙති". යන ප්‍රකාශය තහවුරු කරන්න.

04. i. " නහි වේරේන වේරානි" යන ගාථාව සම්පූර්ණ කර ලියන්න.

ii. අසීමිත තෘෂ්ණාව, මානය, වෛරය හා පලිගැනීම නිසා යුද ගැටුම් ඇවිලෙන ආකාරය පැහැදිලි කරන්න.

iii. " ලෝක සාමය උදාකර ගැනීමට මඟ බුදුසමයෙහි දැක්වේ". යන ප්‍රකාශය තහවුරු කරන්න.

05. i. පංචශීලය ලියා දක්වන්න.

ii. " පංච ශීලය නොරැකෙන සමාජයක මතුවිය හැකි සාමාජිකථ ආර්ථික, සෞඛ්‍ය හා සදාචාරමය ව්‍යසනය අතිශය බිහිසුණුය." යන ප්‍රකාශය පැහැදිලි කරන්න.

iii. " බෞද්ධ සමාජයක මානව අයිතීන් තහවුරු වන්නේ පංචශීල සමාදානයෙහි.". යන ප්‍රකාශය තහවුරු කරන්න.

06. i. සිඟාලෝවාද සූත්‍රයෙහි පූර්ව දිසා නමස්කාරයෙහි දෙමවුපියන් විසින් දරුවන්ට ඉටුකළ යුතු යුතුකම් පහක් දක්වා තිබේ. එම යුතුකම් පහ දක්වන්න.

ii. මිතුරන්ට සංග්‍රහ කළ යුතු ආකාර පහක් සහ එවිට ලැබෙන ප්‍රති උපකාර පහක් සිඟාලොවාද සූත්‍රයේ දැක්වේ. එම කරුණු කවරේදැයි දක්වන්න.

iii. " ඕනෑම ගෘහස්ථ විවාහක පුරවැසියෙකුට තම සමාජ ජීවිතය තුළ ක්‍රියාකරන්නට සිදුවන අවම රාමුව සිඟාලෝවාද සූත්‍රයෙහි දැක්වේ. මෙම කියමන පැහැදිලි කරන්න.

07. i. දැඩි වීර්යය ගැන කියවෙන ' යෝ චේ වස්සසතං ජීවේ' යන ගාථාව සම්පූර්ණ කර ලියන්න.

ii. උට්ඨාන වීර්යයෙන් ආර්ථික ශක්තිය ගොඩනගා ගැනීමට උපදෙස් මාලාවක් අංගුත්තර නිකායේ එයි එම උපදෙස් මාලාව දක්වන්න.

iii. " උට්ඨාන වීර්යයෙන් උපයා ගැනීමටත්, අර්ථ සම්පන්නව ධනය පරිභෝජනය කිරීමටත් බුදුසමය උපදෙස් දෙයි". මෙම කියමන සනාථ කරන්න.

* * *



Scanned by CamScanner